| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.08.12 පැය 1440 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1573/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**අනවසර විදුලි රැහැනක ගැටී පුද්ගලයින් දෙදෙනෙකු මිය යාම - ඌරගස්මංහන්දිය පොලිස් වසම**

2025.08.12 වන අද දින උදෑසන කාලයේ ඌරගස්මංහන්දිය පොලිස් වසමේ අඹ ගහ හන්දිය ආසන්න ප්‍රදේශයේ වෙල්යායක සතුන් දඩයම් කිරීම සඳහා අනවසරයෙන් දමන ලද විදුලි රැහැනක ගැටී පුද්ගලයින් දෙදෙනෙක් මිය ගොස් සිටින බවට ලද පැමිණිල්ලක් මත ඌරගස්මංහන්දිය පොලිසිය විසින් විමශර්න ආරම්භ කරන ලදි.

**මරණකරුවන් වයස අවුරුදු 46 ක් හා 39 ක් වන ඌරගස්මංහන්දිය ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

අනවසර විදුලි රැහැන් අදින ලද බවට සැකපිට පුද්ගලයින් දෙදෙනෙකු පොලිසිය මඟින් අත්අඩංගුවට ගෙන ඇත. මෘත ශරීර සිද්ධිය සිදු වු ස්ථානයේ මහේස්ත්‍රාත් පරීක්ෂණය සඳහා පොලිස් ආරක්ෂාව යටතේ ඇති අතර උරගස්මංහන්දිය පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**